ලංසු සඳහා ආරාධනයයි

ආරක්ෂක අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ, ත්‍රිකුණාමලය, නාවික නැව් තටාකාංගණයේ ජැටිය සැලසුම් කොට ප්‍රතිසංස්කරණය කිරීම

කොන්ත්‍රාත් අංක - MOD/SLN/03/2019

1. ශ්‍රී ලංකාවේ, කොළඹ 03 බාලදක්ෂ මාවතේ අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) සභාපති විසින්, ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා වන ඉහත කාර්යය සැලසුම් කොට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,236.00 වන අතර, නිම කිරීමේ කාලය ලිත් දින 735 කි. අදළ වැඩ බිම, ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය, නාවික නැව් තටාකාංගනයේ පිහිටා ඇත.

2. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (ICB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමේ ප්‍රභවය ශ්‍රී ලංකා රජය වේ. ශ්‍රී ලංකාවේ දේශීයව ලියාපදිංචි කළ ආයතන/ බද්ද ව්‍යාපාර වෙතින් ලංසු භාරගනු ලැබේ. විදේශ ලංසුකරුවන්, ලංසු ඉදිරිපත් කිරීම සඳහාත් අදළ කාර්යය ඉටුකිරීම සඳහාත්, යථා පරිදි සංස්ථාපනය කරන ලද හෝ කිරීමට අපේක්ෂිතව සිටින ප්‍රසිද්ධ ශ්‍රී ලාංකික ඉදිකිරීම් ආයතනයක් සමග බද්ධ ව්‍යාපාරයක් ලෙස කටයුතු කළ යුතුය. ශ්‍රී ලාංකික (දේශීය) ලංසුකරුවන්හට, පසුගිය වසර පහළොව (15) තුළ සමාන ස්වභාවයේ හා විශාලත්වයේ වරාය දියකඩන/ ජැටි ඉදිකිරීම් ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත විදේශ හවුල්කරු සමග යථා පරිදි සංස්ථාපනය කරන ලද හෝ කිරීමට අපේක්ෂිත බද්ධ ව්‍යාපාර ලෙස ලංසු ඉදිරිපත් කළ හැකිය.

3. ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

   අ) පසුගිය වසර 15 තුළ එක් එක් ව්‍යාපෘතියක වටිනාකම අවම වශයෙන් **රුපියල් මිලියන 3,236.00 වූ**, සමාන ස්වභාවයේ, සමාන සංකීර්ණතාවයේ ජැටි / වරාය දියකඩන ව්‍යාපෘති 02 ක් හා පසුගිය වසර 15 තුළ, එක් එක් ව්‍යාපෘතියක වටිනාකම අවම වශයෙන් **රුපියල් මිලියන 900 වූ** අක්වෙරළ පයිලිං සැලසුම් හා ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

   ආ) අදළ බද්ධ ව්‍යාපාරයේ දේශීය හවුල්කරු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය සතු අයකු විය යුතුය.

   C1 හෝ ඉහළ ශ්‍රේණියක් - සමුද්‍රීය ඉදිකිරීම්.

   හෝ

   C1 හෝ ඉහළ ශ්‍රේණියක් - පාලම් ඉදිකිරීම

   ඇ) බද්ධ ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු, ඕනෑම රටක අපලේඛනගත වූ අය නොවිය යුතුය.

   ඈ) පසුගිය වසර පහ තුළ කෙරෙමින් පවත්නා හෝ සම්පූර්ණ කළ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ලැබූ මුළු සහතික කළ ගෙවීම්වල වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍ය ශ්‍රී ලංකා **රුපියල් මිලියන 2,427.00 විය යුතුය.**

   ඉ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර ශ්‍රී ලංකා රුපියල් මිලියන 405.00 විය යුතුය.

   ඊ) ලංසුකරු සතුව, ශ්‍රී ලංකාවේ 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් තිකුත් කරන ලද වලංගු සහතිකයක් තිබිය යුතු අතර, එහි මුල් පිටපතක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

4. මෙරට ලංසුකරුවන්හට, දේශීය ප්‍රමුඛතා අවශ්‍යතාව අදළ වේ.

5. ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු **ශ්‍රී ලංකා රුපියල් 300,000.00** ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 03, බාලදක්ෂ මාවතේ අංක 15/5, බිම් මහලේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී/ (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, **2019.09.23 දින සිට 2019.12.16 දින දක්වා**, (රජයේ හා බැංකු නිවාඩු දින හැර) ඕනෑම රාජකාරි දිනයකදී, **0900 පැය හා 1500 පැය** අතර කාලය තුළ අපේක්ෂිත ලංසුකරුවන්හට, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ඒකකයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ.

6. ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර, ශ්‍රී ලංකාවේ, කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන්, ගෙවීමකින් තොරව **2019.09.23 දින සිට 2019.12.06 දින දක්වා 0900 පැය හා 1500 පැය** අතර කාලය තුළ පරීක්ෂා කොට බැලිය හැක.

අධ්‍යක්ෂ ජනරාල් - සිවිල් ඉංජිනේරු

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය
කොඩිගහ විදිය,
කොළඹ 01.
ශ්‍රී ලංකාව.

දුරකථන අංක :

DGCE +94-117195211
DNCE +94-117195212
ෆැක්ස් : **+112436950**
ඊමේල් - **dgcenhq@gmail.com**

ලංසු, 2020.06.22 දින දක්වා (ලංසු අවසන් දින සිට දින189 ත් දක්වා වලංගු විය යුතුය.

7. අදළ ලංසු ඇපකරය, ශ්‍රී ලංකා රුපියල් මිලියන 50 ක් වටිනා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රසිද්ධ වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් විය යුතුය.

8. අදළ ලංසු ඇපකරය, ලංසු අවසාන දිනයේ සිට **2020.07.20** දින දක්වා (දින 217) වලංගු විය යුතුය.

9. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, 2019.11.07 දින 1100 පැයට ශ්‍රී ලංකාවේ, ත්‍රිකුණාමලය, නාවික නැව් තටාකාංගනයේදී පැවැත්වීමට නියමිත අතර, ඉන් පසුව වැඩ බිම් චාරිකාවක් සංවිධානය කෙරේ. මෙම අවස්ථා දෙකකට සහභාගි වන ලෙසට සියලුම ලංසුකරුවන්හට උපදෙස් හා උනන්දු කිරීම් කරනු ලැබේ.

10. ලංසු මුල් පිටපත හා දෘඪ පිටපත් (hard Copies) දෙකකින් (2) සහ සංයුක්ත තැටියක (CD) සටහන් කරන ලද එක් (1) මෘදු පිටපතක්ද (Soft Copy) වශයෙන් ඉංග්‍රීසි බසින් සම්පූර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන 2019.12.17 වන දින 1000 පැයට හෝ ඉන් පෙර කොළඹ 03, බාලදක්ෂ මාවතේ, නො. 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනැවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ යුතුය. ලංසු ඇසුරුම්වල පිටත ලිපිකවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

11. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2019.12.17 වන දින ලංසු භාර ගැනීම අවසාන වූ වහාම මෙම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් හමුවේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් වෙනුවෙන් පැමිණෙන නියෝජිතයන් ලංසුකරුගේ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. බලය පැවරීම ලිපියක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම ඔහු/ ඇය ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමෙන් ඉවත් කරනු ලැබීමට හේතුවනු ඇත.

12. ලංසු පිළියෙල කිරීමේදී හෝ භාරදීමේදී හෝ පෙර - ලංසු රැස්වීම් සඳහා සහභාගි වීමේදී හෝ මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව වැඩ බිම් පරීක්ෂා කිරීමේ ගමන් සඳහා හෝ සම්බන්ධව ලංසුකරුට දැරීමට සිදුවන කිසිදු වියදමක් පිළිබඳව සේවා යෝජකයා වගකියනු නොලැබේ.

සභාපති,
කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC)
ආරක්ෂක අමාත්‍යාංශය, 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03, ශ්‍රී ලංකාව.

දිනය : 2019.09.22